සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
குல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

භූගෝල විද්‍යාව - I
Geography - I

22 S I

කාලය පැය තුනයි
03 hours

I කොටස

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. පහත රූප සටහනින් දක්වෙන්නේ ග්ලැසියර් බාදන ප්‍රදේශයක භූ දර්ශනයකි. එම භූ දර්ශනයෙහි A සහ B ලෙස දක්වා ඇති භූ රූප නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ



1.A අරේටය B පිරමිඩාකාර මුදුන
2.A පිරමිඩාකාර මුදුන B අරේටය
3.A මැදි මොරේන B අන් මොරේන
4.A ලම්බ නිම්න B පිත්ත පටි විල්
5.A සර්කය B ආංශික මොරේන
(........)

02. 1:50000 පරිමාණයට අඳින ලද භූ ලක්ෂණ සිතියමක දක්වා ඇති රේඛීය පරිමාණයක පළමු සෙන්ටිමීටර් දෙක මි. මී. දෙකෙන් දෙකට අනු කොටස්වලට බෙදා දක්වා ඇත. එම එක් අනු කොටසකින් දක්වෙන පැබෑ භූමියේ දුර ප්‍රමාණය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1. මීටර් 200
2. මීටර් 300
3. මීටර් 1000
4. මීටර් 100
5. මීටර් 500
(........)

03. 1:50000 භූ ලක්ෂණ සිතියමක පිහිටි කඳු වැටියක මුදුනින් ආරම්භ වන ගංගාවන් කන්ද වටා ගමන් කිරීමෙන් නිර්මාණය කෙරෙන ජලවහන රටාව වන්නේ

1. සවිරාම ජලවහන රටාව
2. ජාලාකාර ජලවහන රටාව
3. යාබීය ජලවහන රටාව
4. අරීය ජලවහන රටාව
5. වලයාකාර ජලවහන රටාව
(........)

04.1:50000 භූ ලක්ෂණ සිතියමක ඇඳ ඇති ජාතික ඛණ්ඩාංක දෙකක් අතර දුර නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.මීටර් 2000　　2.මීටර් 3000　　3.මීටර් 10000　　4.මීටර් 1000
5.මීටර් 5000　　(........)

05.1:50000 භූ ලක්ෂණ සිතියමක රෝස පැහැයෙන් සහ දුඹුරු පැහැයෙන් දක්වන ලක්ෂණ පමණක් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

1.ඉදිකළ ප්‍රදේශය සහ වැලි වැටි　　2.ඉදිකළ ප්‍රදේශය සහ අප්‍රධාන මාර්ගය
3.ප්‍රධාන මාර්ගය සහ ළඳු කැලෑ　　4.වතුරු බිම් සහ සමෝච්ඡ රේඛා
5.සමගැඹුරු රේඛා සහ සමෝච්ඡ රේඛා　　(........)

06.භූගෝලීය තොරතුරු පද්ධතියක දෛශික ආකෘතිය යටතේ ගංගාවක් නිරූපණය කරනු ලබන්නේ

1.එකිනෙක යා කර ඇති බහු අශ්‍ර මගිනි　　2.රේඛාවක් මගිනි
3.බහු අශ්‍රයක් මගිනි　　4.පික්සල් මගිනි
5.රේඛා සහ බහු අශ්‍ර මගිනි　　(........)

07.භූගෝලීය තොරතුරු පද්ධතිය ආශ්‍රිත සංරචක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

1.දත්ත සහ අභ්‍යාවකාශ උපාංග　　2.දත්ත ග්‍රහණය සහ විශ්ලේෂණය
3.දත්ත සහ ක්‍රමවේද　　4.මානව සම්පත් සහ පාලක උපාංග
5.අභ්‍යාවකාශ උපාංග සහ දෘඩාංග　　(........)

08.ගමනා ගමන කටයුතුවලදී වඩාත් බහුලව භාවිතා කරනු ලබන නවීන සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රමය වනුයේ

1.භූ ලක්ෂණ සිතියම්　　2.ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය
3.භූගෝලීය තොරතුරු පද්ධතිය　　4.දුරස්ථ සංවේදය
5.ගුවන් ඡායාරූප　　(........)

09.දුරස්ථ සංවේද ක්‍රම ශිල්පයෙහි භාවිතා වන ක්‍රමවේදයන් පිළිවෙළින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.වස්තුන් ග්‍රහණය කර ගැනීම, දත්ත පටිගත කිරීම,දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය
2.දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය, දත්ත පටිගත කිරීම, වස්තුන් ග්‍රහණය කර ගැනීම
3.දත්ත පටිගත කිරීම,වස්තුන් ග්‍රහණය කර ගැනීම,දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය
4.විකිරණ නිකුත් කිරීම, දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය.දත්ත හා තොරතුරු විශ්ලේෂණය
5.දත්ත හා තොරතුරු විශ්ලේෂණය, විකිරණ නිකුත් කිරීම,දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය
(........)

10.භූගෝල විද්‍යාවේ භාවිතා කරන දත්ත වල සුවිශේෂී ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ

1.දත්ත හා තොරතුරු ගුණාත්මක ප්‍රවේශයකින් පමණක් ඉදිරිපත් කිරීමයි
2.දත්ත හා තොරතුරු ප්‍රමාණාත්මක ප්‍රවේශයකින් පමණක් ඉදිරිපත් කිරීමයි
3.දත්ත හා තොරතුරු කාලික වශයෙන් පමණක් ඉදිරිපත් කිරීමයි
4.දත්ත හා තොරතුරු අවකාශීය වශයෙන් පමණක් ඉදිරිපත් කිරීමයි
5.දත්ත හා තොරතුරු කාලික හා අවකාශීය වශයෙන් ඉදිරිපත් කිරීමයි　　(........)

11.දත්ත වර්ගීකරණය කිරීමේ දී අඛණ්ඩව විහිදීමක් නැති සංඛ්‍යා දත්තවලට උදාහරණ පමණක් අඩංගු වී ඇති පිළිතුර වන්නේ

1.උස, බර, උෂ්ණත්වය
2.උස, පවුලක දරුවන් සංඛ්‍යාව , ගමක ඇති වගා ළිං සංඛ්‍යාව
3.උෂ්ණත්වය ,වර්ෂාපතනය, පීඩනය
4.පවුලක දරුවන් සංඛ්‍යාව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් සංඛ්‍යාව, ගමක සමෘද්ධිලාභීන් සංඛ්‍යාව
5.ආර්ද්‍රතාවය, උෂ්ණත්වය,වර්ෂාපතනය　　(........)

12.වායුගෝලයේ මෙසෝගෝලීය ස්ථරය තුළ උෂ්ණත්වය පහළ බැසීමට හේතුව ලෙස සැලකිය හැක්කේ

1.ජල වාෂ්ප,වළාකුළු සහ දූවිලි අංශුවලින් තොර වීමය
2.ධන සහ සෘණ ආරෝපණ ක්‍රියාකාරීත්වයක් ඉහළ මට්ටමක පැවතීමය
3.උෂ්ණත්ව ප්‍රතිලෝමයක් ක්‍රියාත්මක වීමය
4.එක්ස් සහ ගැමා කිරණවල ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමක පිහිටීමය
5.අධෝරක්ත කිරණ විශාල වශයෙන් අවශෝෂණය කිරීමය (........)

13.ජලගෝලයෙහි මිරිදිය ලෙස ගැනෙන ජල ප්‍රමාණය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1. 3 % 2. 97 % 3. 78 % 4. 21 % 5. 71 % (........)

14.පෘථිවි අභ්‍යන්තර ස්කන්ධයෙන් 2/3 ක් පමණ අයත් වන ස්ථරය ලෙස සැලකෙන්නේ

1.කබොල 2.ප්‍රාවරණය 3.ඇතුළත හරය 4.පිටත හරය
5.මොහොරොවිසික් අසන්තතිය (........)

15.පහත P,Q,R,S ලෙස දක්වා ඇති භූ රූප නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ



1.P සමමිතික නැමුම Q අසමමිතික නැමුම R සමානති නැමුම S ඔත් නැමුම
2.P අසමමිතික නැමුම Q සමමිතික නැමුම R සමානති නැමුම S ඔත් නැමුම
3.P ඔත් නැමුම Q සමමිතික නැමුම R සමානති නැමුම S අසමමිතික නැමුම
4.P සමානති නැමුම Q සමමිතික නැමුම R ඔත් නැමුම S අසමමිතික නැමුම
5.P ඔත් නැමුම Q උලැගි නැමුම R සමානති නැමුම S අසමමිතික නැමුම (........)

16.සිලිකා සංයුතිය 50%ට වඩා අඩු,යකඩ සංයුතිය 50%ට වඩා වැඩි ආග්නේය පාෂාණයකට උදාහරණයක් ලෙස සැලකිය හැක්කේ

1.ඇන්ඩිසයිට් 2.ගැබ්රෝ 3.බැසෝල්ට් 4.පෙරිඩොටයිට්
5.ඩොලරයිට් (........)

17.පසෙහි රසායනික ජීරණය සඳහා බලපාන සාධකයක් ලෙස සැලකිය හැක්කේ

1.වර්ෂාව 2. උෂ්ණත්වය 3. වෘක්ෂලතා 4.කෘෂි උපකරණ
5.වායු පීඩනය (........)

18.ශ්‍රී ලංකාවේ ලිමොනයිට් සහ මැග්නටයිට් හමුවන ප්‍රදේශ නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1.රත්නපුර සහ පුත්තලම 2.අනුරාධපුර සහ ඔක්කම්පිටිය
3.කලාතු ඔය සහ සයිනාවල 4.සේරුවාවිල සහ මාතර
5.තහවත්ත සහ මීටියාගොඩ (........)

19. පහත රූප සටහනෙහි දක්වෙන්නේ ගංගාවක දික් පැතිකඩකි. එහි A සහ B ලෙස දක්වා ඇති අවධීන්වල සුවිශේෂී ලක්ෂණ නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ



1. A සිරස් සංඝර්ෂණය ඉහළය — B ගං භාරය අධිකය
2. A ජල ප්‍රමාණය අධිකය — B බෑවුම් අනුක්‍රමණය ඉහළය
3. A ආංශික සංඝර්ෂණය තීව්‍ර ය — B ගං භාරය කුඩාය
4. A ගංගාවේ අනුක්‍රමණය ඉතා අඩුය — B ඛාදිත භූ රූප නිර්මාණය කරයි
5. A අතු ගංගා රැසක් එකතු වේ — B ජලයේ ප්‍රවේගය වැඩිය

(.......)

20. විසුවියස් සහ හෙක්ලා යන ගිනි කඳු පිහිටා ඇති රටවල් දෙක නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ

1. ඉන්දුනීසියාව හා ජපානය
2. පිලිපීනය සහ අයිස්ලන්තය
3. ඉතාලිය සහ අයිස්ලන්තය
4. සිසිලිය සහ පිලිපීනය
5. ඉතාලිය සහ ඇමරිකා එක්සත් ජනපදය

(........)

21. කාන්තාර ප්‍රදේශයක අවලම්බන ක්‍රියාවලිය තීරණය කරන සාධක පමණක් දක්වා ඇති පිළිතුර වන්නේ

1. සුළඟේ වේගය හා භාරයේ ස්වරූපය
2. කාන්තාර වර්ගය හා වායුගෝලීය සංයුතිය
3. වායුගෝලීය පීඩන අනුක්‍රමණය සහ ජල වාෂ්ප
4. සුළඟේ වේගය සහ සූර්ය තාපනය
5. කාන්තාර පිවි විශේෂ සහ භාරයේ බර

(........)

22. යාබද සිතියමෙහි දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පාංශු කලාප දක්වෙන සිතියමකි.එහි A සහ B ලෙස දක්වා ඇති පාංශු ගණ නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

1. A රතු දුඹුරු ලැටසෝල් පස — B රතු කහ පොඩ්සොලික් පස
2. A රතු දුඹුරු පස — B රතු දුඹුරු ලැටසෝල් පස
3. A රතු කහ ලැටසෝල් පස — B ක්ෂාරීය නොවන දුඹුරු පස
4. A රතු දුඹුරු පස — B ග්‍රැමසෝල් පස
5. A දියළු පස — B රතු දුඹුරු පස



(........)

23.වෙරළ ප්‍රදේශයක බිඳෙන රළ පාෂාණ ස්තරවල වැදීමෙන් ඒවායෙහි ඇති සිදුරු ජලයෙන් පිරී ඒවා අනුපීඩනයකට ලක් වේ. ජලය බැසගිය පසු නැවත එම සිදුරු වාතයෙන් පිරී යයි.මෙම ක්‍රියාවලිය දිගින් දිගටම සිදුවීමනිසා වෙරළ ඛාදනය සිදු වේ.මෙම ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ

1.සංඝර්ෂණය 2.උල්ලේඛය 3.පිරිපැරීම 4.අපහරණය 5.ද්‍රාව උත්පාටනය (........)

24.නාය යෑම් කෙරෙහි බලපාන භෞතික සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

1.වර්ෂාපතනය , භූ විෂමතාව , වනහරණය

2.ඛනිජ නිස්සාරණය , භූ විහූනය, භූ කම්පන

3.වර්ෂාපතනය , භූ විහූනය , භූ කම්පන

4.වර්ෂාපතනය , අක්‍රමවත් භූමි පරිහරණය, පාෂාණ පිරණය

5.බෑවුමේ ස්වභාවය, හිමවල බලපෑම, උස්බිම්වල ජලය රඳවා තැබීම (........)

25.දේශගුණය පාලනය කරන සාධකයන් ලෙස පෘථිවිය හා සූර්යයාට ඇති දුර සහ පෘථිවි පරිභ්‍රමණය වැනි සාධක වර්ගීකරණය කළ හැක්කේ

1.විශ්ව සාධක ලෙසය 2.ගෝලීය සාධක ලෙසය 3.ප්‍රාදේශීය සාධක ලෙසය

4.ස්ථානීය සාධක ලෙසය 5. විශ්වීය හා ගෝලීය සාධක ලෙසය (........)

26.ජනගහන විද්‍යාඥයින් ප්‍රකාශකර ඇති ආකාරයට ලෝක ජන සංඛ්‍යාව බිලියන 08ක් ලෙස වාර්තා විය හැක්කේ

1.වර්ෂ 2018 ත් 2020ත් අතරය 2.වර්ෂ 2020ත් 2030ත් අතරය

3.වර්ෂ 2030 ත් 2040ත් අතරය 4.වර්ෂ 2040ත් 2050ත් අතරය

5.වර්ෂ 2050න් පසුවය (........)

27.මහාද්වීප අනුව ලෝක ජනසංඛ්‍යාව ආරෝහණ පිළිවෙළට පෙළ ගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ

1.ආසියාව,අප්‍රිකාව,යුරෝපය,උතුරු ඇමරිකාව,දකුණු ඇමරිකාව,ඕස්ට්‍රේලියාව

2.ඕස්ට්‍රේලියාව,දකුණු ඇමරිකාව,උතුරු ඇමරිකාව,යුරෝපය,අප්‍රිකාව,ආසියාව

3.ආසියාව,අප්‍රිකාව,යුරෝපය,දකුණු ඇමරිකාව,උතුරු ඇමරිකාව,ඕස්ට්‍රේලියාව

4.ආසියාව,අප්‍රිකාව,ඕස්ට්‍රේලියාව,උතුරු ඇමරිකාව,දකුණු ඇමරිකාව,යුරෝපය

5.ඕස්ට්‍රේලියාව,අප්‍රිකාව,උතුරු ඇමරිකාව,ආසියාව,යුරෝපය,දකුණු ඇමරිකාව (........)

28.ආහාර ස්ථායීතාව යන්න නිවැරදිව නිර්වචනය කර ඇති පිළිතුර වන්නේ

1.පුද්ගලයෙකුට හෝ කුටුම්භයකට තම කැමැත්ත පරිදි අහාර ලබා ගැනීමට ඇති හැකියාව

2.ආහාර සැපයීම නිෂ්පාදනය හා බෙදා හැරීම හා බැඳී පවතින ලබා ගැනීමේ හැකියාව

3.සෑම කාලයකදීම ආහාර ලබා ගැනීමට ඇති හැකියාව

4.සහනදායී මිලකට අහාර ලබා ගැනීමට ඇති හැකියාව

5.දේශීය වශයෙන් නිෂ්පාදිත ආහාර පමණක් ලබා ගැනීමට ඇති හැකියාව (........)

29.ජන සංඛ්‍යාවක උපත් හා මරණ සම්බන්ධව දී ඇති ප්‍රකාශවලින් වඩාත් ම ගැළපෙන ප්‍රකාශය ලෙස සැලකිය හැක්කේ

1.උපත් සංඛ්‍යාව ඉහළ යන විට මරණ සංඛ්‍යාව පහත වැටේ.

2.උපත් සංඛ්‍යාව ඉහළ යනවිට මරණ සංඛ්‍යාව ද ඉහළ යයි.

3.උපත් සංඛ්‍යාව හා මරණ සංඛ්‍යාව ඉහළ යන විට ජන සංඛ්‍යාව ද වේගයෙන් වර්ධනය වේ.

4.උපත් හා මරණ අනුපාතිකයන් ගණනය කරනු ලබන්නේ වසර දෙකෙන් දෙකට ය.

5.උපත් හා මරණ සීඝ්‍රතාව අවකාශීය හා කාලික වශයෙන් වෙනස්වන ප්‍රපංචයකි. (........)

30.සංක්‍රමණික ධාරාවන් යන්න නිවැරදිව නිර්වචනය කර ඇති පිළිතුර වන්නේ

1.කණ්ඩායම් වශයෙන් රටක් හෝ ප්‍රදේශයක් හෝ හැරගිය පුද්ගල සමූහයකි

2.රැකියා අපේක්ෂාවෙන් සංවර්ධිත රටවලට සංක්‍රමණය වූ පුද්ගල සමූහයකි

3.මැද පෙරදිග රටවලට සිදුවන ශ්‍රම ගලනයයි

4.ප්‍රථමය තත්ත්වයන් ඉක්මවාගෙන ආපන්නතම රටවලට ගමන් කරන පුද්ගල සමූහයකි

5.නීති විරෝධීව සංවර්ධිත රටවල් කරා සංක්‍රමණය වන පුද්ගල සමූහයකි (........)

31.ශ්‍රී ලංකාවේ වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගය 1.7ක් ඉක්මවූ නොවූ දිස්ත්‍රික්ක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ

1.අම්පාර, පුත්තලම, නුවර එළිය 2.අනුරාධපුරය,හම්බන්තොට, මොණරාගල

3.කළුතර, ගම්පහ, පොළොන්නරුව 4.ගම්පහ ,නුවර එළිය, බදුල්ල

5.හම්බන්තොට ,මොණරාගල,පොළොන්නරුව (........)

32.ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා පිරමීඩයේ කාලීන වෙනස්වීම කෙරෙහි බලපාන ජන විද්‍යාත්මක විචල්‍යයක් විය නොහැක්කේ

1.බාල වියස්කාර යැපෙන්නන් ප්‍රමාණය පහත වැටීම 2. වයස්ගත ජන සංඛ්‍යාව ඉහළ යාම

3.ස්ත්‍රී ජන සංඛ්‍යාවේ ඉහළයෑම 4.ස්ත්‍රී පුරුෂ අනුපාතිකයේ සිදුවන පහත වැටීම

5.සාරඵලතාවයේ සිදුවන පහත වැටීම (........)

33.ආසියාවේ ඉහළ නාගරීකරණයක් සහිත රටවල් දෙකක් පමණක් දක්වෙන පිළිතුර වන්නේ

1.ඉන්දියාව සහ පාකිස්ථානය 2.ඉන්දියාව සහ ඉන්දුනීසියාව 3.සිංගප්පූරුව සහ ජපානය

4.පිලිපීනය සහ මැලේසියාව 4.බංගලාදේශය සහ සිංගප්පූරුව (........)

34.ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අඩු නාගරීකරණ මට්ටමක් පැවතීමට බලපාන සාධකයක් විය නොහැක්කේ

1.ප්‍රාදේශීය සභා නාගරික ප්‍රදේශවලට ඇතුළත් කිරීම 2.ගම හා නගරය අතර දැඩි විෂමතාවක් නොවීම

3.ප්‍රාථමික ප්‍රදේශවලට සම්පත් යොමුකර තිබීම

4.ග්‍රාමීය ප්‍රදේශවලට සංවර්ධන යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීම

5.උතුරු නැගෙනහිර පැවති යුද්ධය නිසා එම ප්‍රදේශවල නාගරීකරණය දුර්වල වීම (........)

35.ලෝක නාගරීකරණ මට්ටම හා ප්‍රවණතා සම්බන්ධයෙන් දක්වා ඇති නොගැළපෙන පිළිතුර වන්නේ

1.ආසියා හා අප්‍රිකානු රටවල ඉහළ නාගරීකරණ සීඝ්‍රතාවයක් පැවතීම

2.දැවැන්ත නගර සංවර්ධනය වෙමින් පවතින රටවලින් බිහිවීම

3.1950 සිට වර්තමානය තෙක් ලොව පුරා ඉතා වේගවත් නාගරීකරණයක් වාර්තාවීම

4. ලෝකයේ පළමු වරට 2007 වර්ෂයේ දී නාගරික ජන සංඛ්‍යාව ග්‍රාමීය ජන සංඛ්‍යාව ඉක්මවා යාම

5. සංවර්ධනය වන රටවල නාගරීකරණයත් සමග අවිධිමත් අංශය සීඝ්‍රයෙන් පහත වැටීම (.......)

36.සත්වයන් හා ශාක අතර වුව ද ජාන තාක්ෂණය යටතේ සම්මිශ්‍රණ කළ හැකිය. එවැන්නකට උදාහරණයක් වන්නේ

1.BT බඩ ඉරිඟු ප්‍රභේදය 2.තොරින් 10 තිරිඟු ප්‍රභේදය 3. IR 8 වී ප්‍රභේදය

4.IR 64 වී ප්‍රභේදය 5.ප්‍රන්ධාමාසී බාර්ලි විශේෂය (........)

37.ශ්‍රී ලංකාවේ රජරට ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති වකුගඩු රෝගයට බල පා ඇති ප්‍රධානම හේතුව ලෙස පැලකෙන්නේ

1.ජාන විකෘති කරන ලද බීජ භාවිතය 2.රසායනික ගොවිතැන කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම

3.හේන් ගොවිතැන ආශ්‍රිත වනාන්තර බිම් එළි කිරීම 4.දෙමුහුන් බීජ වැඩිවශයෙන් භාවිතා කිරීම

5.වී වගාවේ දී වැඩි වශයෙන් ග්ලයිෆොස්පේට් භාවිතය (........)

38.හරිත විප්ලවයේ බලපෑම තුන්වන ලෝකයේ රටවලට අහිතකර අන්දමින් බල පා ඇති බවට දැක්විය හැකි වඩාත් හොඳම සාධකය වන්නේ

1.දිළිඳු ගොවීන් දිගින් දිගටම ණය බරින් යුක්තවීම 2.ගොවි බිම් යාන්ත්‍රිකරණය වීම

3.කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැකියා විරුක්කියක් පහළ යාම 4.කෘෂි අපනයන ආදායම පහත වැටීම

5.දේශීය කෘෂි ආදේශන දිරිගැන්වීම (........)

39. ශ්‍රීලංකාවේ ආරම්භකර ඇති විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් නොවන පිළිතුර වන්නේ

1.දඹුල්ල 2.කහටගස්දිගිලිය 3.මීගොඩ 4. නාරාහේන්පිට 5.වැලිසර (........)

40.ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළෙහි ව්‍යාප්තව ඇති ඛනිජ වැලි සංචිතය වන්නේ

1.ඉල්මනයිට් 2.සිලිකා මිනිරන් 3.ඇපටයිට් 4.මිනිරන් 5.මැණික් (........)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

භූගෝල විද්‍යාව - I
Geography - I

22 | S | I

II කොටස

උපදෙස් :

★ පළමු සහ දෙවන ප්‍රශ්නවලටත් , 3 හා 4 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න
★ 1 : 50000 ගාල්ල හූ ලක්ෂණ සිතියමෙහි කොටසක් සපයා ඇත.

01.ශ්‍රී ලංකාවේ මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ ගාල්ල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත.එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. මෙම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1.සිතියම්ගත ප්‍රදේශයේ උතුරු අර්ධයේ බටහිර සිට නැගෙනහිරට දිවෙන ප්‍රධාන මාර්ගය කවර ශ්‍රේණියකට අයත් වූවක් ද ? (ලකුණු 01)

2.සිතියම්ගත ප්‍රදේශයේ ඊශාන දිග කාර්තුවෙහි හඳුනාගත හැකි පරිපාලන මායිම කවරක් ද? (ලකුණු 01)

3.සිතියම්ගත ප්‍රදේශයේ නැගෙනහිර සීමාවට ආසන්නව P ලෙස නම් කරන ලද චතුරස්‍රයෙහි දක්වා ඇති වැව 1:25000 පරිමාණයට ඇඳ දක්වන්න (ලකුණු 02)

4. සිතියම්ගත ප්‍රදේශය සඳහා රේඛීය පරිමාණය නිර්මාණය කරන්න (ලකුණු 02)

5.සිතියම්ගත ප්‍රදේශයේ දකුණු සීමාව හරහා දිවෙන දුම්රිය මාර්ගයෙහි දක්වා ඇති දුම්රිය නැවතුම් සංඛ්‍යාව කීය ද? (ලකුණු 02)

6.සිතියම්ගත ප්‍රදේශයේ A,B,C,D ලෙස දක්වා ඇති ලක්ෂණ නිවැරදිව හඳුනාගෙන නම් කරන්න (ලකුණු 04)

7.සිතියම්ගත ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපා ඇති ක්ෂේත්‍ර පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 04)

8.සිතියම්ගත ප්‍රදේශය අධික ජන ඝනත්වයක් සහිත ප්‍රදේශයක් බවට පත්වීම කෙරෙහි බලපා ඇති සාධක කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 04)

02.සපයා ඇති ලෝක සිතියමෙහි පහත දී ඇති දෑ ලකුණු කර නම් කරන්න

1.වසර 2050 වන විට ලෝක ජන සංඛ්‍යාවෙන් සිව්වන ස්ථානය ගන්නා අප්‍රිකානු රට
2.2018 සැප්තැම්බර් මස ජේබි නැමති සුළි කුණාටුවෙන් හානියට පත් නැගෙනහිර ආසියාතික රට
3.2018 මාර්තු මස ඇමරිකා එක්සත් ජනපදයට ආසන්න පැසිෆික් සාගරයේ පුපුරාගිය ගිනි කන්ද
4.නැස්කා භූ තැටිය
5.පක්ෂිපාද ඩෙල්ටාවක් සහිත ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි ගංගාව
6.ඇන්ඩීස් නැමි කඳු පද්ධතිය
7.ආක්ටික් වෘත්තය
8.2018 සැප්තැම්බර් මස රික්ටර් මාපක 7.5ක භූ කම්පන තත්ත්වයක් වාර්තා වූ ඉන්දුනීසියාවට අයත් දූපත
9.ආරාෆුරා මුහුදු ප්‍රදේශය
10.වේගයෙන් කාන්තාරීකරණයට ලක්වන අප්‍රිකාවේ සාහෙල් ප්‍රදේශය (ලකුණු 20)

03.1.භූගෝලීය තොරතුරු පද්ධතියක ප්‍රධානතම කර්යය කවරක් ද ? (ලකුණු 02)

2.භූගෝලීය තොරතුරු පද්ධතියක් කවර භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයන් සඳහා භාවිත කළ හැකි ද යන්න කෙටියෙන් විමසන්න (ලකුණු 06)

3.භෞගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති ආශ්‍රිත තාක්ෂණය රූප සටහනක් අධාර කර ගනිමින් විස්තර කරන්න (ලකුණු 06)

4.දුරස්ථ සංවේද,ගුවන් ඡායාරූප,චන්ද්‍රිකා ප්‍රතිබිම්බ භූතන සිතියම් නිර්මාණය සඳහා යොදා ගැනීමේ වාසි තුනක් විස්තර කරන්න (ලකුණු 06)

04.1.දත්ත සහ තොරතුරු අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 02)

2.කිසියම් ප්‍රදේශයකට බලපාන ලද ගංවතුර තත්ත්වයක් සම්බන්ධයෙන් කෙරෙන භූගෝලවිද්‍යාත්මක පර්යේෂණයක දී දත්ත හා තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 06)

3.ප්‍රාථමික දත්ත එකරාශි කිරීමේ ක්‍රමවේද තුනක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 06)

4.දත්ත එකරාශි කිරීමේ වැදගත්කම කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 திசை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

භූගෝල විද්‍යාව - II Geography - II	22 S II	කාලය පැය තුනයි 03 hours

උපදෙස්:

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

I කොටස භෞතික භූගෝල විද්‍යාව

01.1.සෞරග්‍රහ මණ්ඩලය ඒකදෙකලා පද්ධතියක් ලෙස හඳුන්වන්නේ ඇයිදැයි කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 2)

2.වායුගෝලයේ සිරස් උෂ්ණත්ව ව්‍යාප්තිය රූප සටහනක් අධාර කරගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 6)

3.පෘථිවි පද්ධතිය තුළ ජීවය පවත්වාගෙන යාම සඳහා වායුගෝලයෙහි වැදගත්කම කරුණු තුනක් මගින් පැහැදිළි කරන්න (ලකුණු 6)

4.ජෛව පද්ධතියෙහි සමතුලිතතාව බිඳ වැටීම කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් විස්තර කරන්න (ලකුණු 6)

02. 1.පහත රූප සටහනෙහි A සහB ලෙස දක්වා ඇති ස්ථරයන් වල සුවිශේෂී ක්‍රියාකාරීත්වයන් එක බැගින් සඳහන් කරන්න (ලකුණු 2)



2.පෘථිවි අභ්‍යන්තරයෙහි උෂ්ණත්වය හා පීඩනය පන සංසිද්ධීන්ගේ ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිළි කරන්න (ලකුණු 6)

3.ආග්නේය පාෂාණ නිර්මාණ ක්‍රියාවලිය පැහැදිළි කර වර්ණය අනුව එය වර්ග කොට දක්වන්න (ලකුණු 6)

4.ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාෂාණ ශ්‍රේණි තුන නම් කර ඉන් එක් ශ්‍රේණියක සුවිශේෂී ලක්ෂණ දළ සිතියමක් ආධාර කර ගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 6)

03.1.A , B සහ C ලෙස නම්කර ඇති භූ රූප අතරින් ලොපොලිත සහ ලැකොලිත යන භූ රූප දක්වෙන අක්ෂර පිළිවෙළින් ලියා දක්වන්න



A



B



C

(ලකුණු 2)

2.කාන්තාර ප්‍රදේශවල සිදුවන බාදන ආකාර තුන කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 6)

3.පහත සඳහන් වෙරළ බාදන භූ රූප රූප සටහන් අධාර කර ගනිමින් විස්තර කරන්න

1. මුහුදු ආරුක්කු 2.මුහුදු කුළු 3.හුම්මානය (ලකුණු 6)

4.ග්ලැසියර් ප්‍රදේශවල නිධිපාධනය හේතුකොටගෙන නිර්මාණය වන පහත සඳහන් භූ රූප දළ රූප සටහනක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න

1.ආංශික මොරේන 2.මැදි මොරේන 3.අන් මෙරේන (ලකුණු 6)

04.1.පෘථිවියෙහි උෂ්ණත්ව ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න (ලකුණු 2)

(ලකුණු 6)

2.ප්‍රාථමික සංසරණයට අයත් සුළං සංසරණ රටා රූප සටහනක් අධාර කර ගනිමින් පැහැදිලි කරන්න

(ලකුණු 6)

3.ශ්‍රී ලංකාවේ දේශගුණය නිරණය කිරීම කෙරෙහි පහත සඳහන් සාධක කවර ආකාරයෙන් බලපෑම් ඇතිකරයි ද යන්න පැහැදිලි කරන්න

1.අන්තර් නිවර්තන අභිසරණ කලාපය තුළ පිහිටීම
2.බෙංගාල බොක්ක ප්‍රදේශයට ආසන්නව පිහිටීම
3.මධ්‍ය කඳුකරයේ පිහිටීම

4. යාබද සිතියමෙහි දක්වා ඇත්තේ කෙපන්ගේ දේශගුණ වර්ගීකරණය පටතේ හඳුන්වා දී ඇති ප්‍රධාන දේශගුණ වර්ගයක් දක්වෙන ප්‍රදේශයකි.

1.සිතියමෙහි ඡේදාකර ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන එම දේශගුණ වර්ගය කවරක් ද ? (ලකුණු 2)

2. එම දේශගුණ වර්ගයෙහි දක්නට ලැබෙන පුවියෙහි ලක්ෂණ පහත ශීර්ෂ යටතේ විස්තර කරන්න

1.දේශගුණික ලක්ෂණ

2.ස්වභාවික වෘක්ෂලතා (ලකුණු 4)

II කොටස මානව භූගෝල විද්‍යාව

05.1.ජන සංඛ්‍යාවක විශාලත්වය යන්නෙන් කුමක් අදහස්වේ ද? (ලකුණු 2)

2.පහත ප්‍රස්තාර සටහනෙහි P සහ Q ලෙස දක්වා ඇත්තේ ලෝකයේ එක්තරා රටවල් දෙකක ජන සංඛ්‍යා වර්ධන ප්‍රවණතාවන්ය. එම එක් එක් රටවල් විසින් ක්‍රියාවට නැංවිය යුතු ජනවිද්‍යාත්මක ප්‍රතිපත්තීන් පිළිබඳව වෙන් වෙන් වශයෙන් විමසීමක් කරන්න (ලකුණු 6)



මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ සංවිධානය

3.ප්‍රසාරණ පිරමීඩයක් සහිත රටක් මුහුණදෙන ජනවිද්‍යාත්මක ගැටලුවලට බලපාන හේතු තුනක් විස්තර කරන්න (ලකුණු 6)

4.මෑත දශක කිහිපයක සිට ශ්‍රී ලංකාවේ ජනයා අවතැන්වීම කෙරෙහි බලපෑ හේතු තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 6)

06.1.ජනාවාසයක දැකිය හැකි මූලිකාංග දෙකක් නම් කරන්න (ලකුණු 2)

2.ග්‍රාමීය ජනාවාසයක දැකිය හැකි ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 6)

3.නාගරීකරණයේ සාධනීය ලක්ෂණ මොනවාදැයි යන්න සාකච්ඡා කරන්න (ලකුණු 6)

4.ශ්‍රී ලංකාවේ නාගරීකරණය හේතුකොටගෙන ඇති වී තිබෙන සමාජ ආර්ථික ගැටලු විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න (ලකුණු 6)

07.1.කෘෂිකාර්මික තාක්ෂණය හා සම්බන්ධ හරිත විප්ලවයෙහි ප්‍රධාන අංග දෙක නම් කරන්න (ලකුණු 2)

2.ජාන තාක්ෂණික ක්‍රමවේද කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හඳුන්වාදීම මගින් ලඟා කරගෙන ඇති ජයග්‍රහණ පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 6)

3.ජෛවීය කෘෂිකර්මය යන්න කෙටියෙන් හඳුන්වා එය ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේද තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 6)

4.කෘෂිකාර්මික ඒකාධිකාරීත්වය සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ඇති කෙරෙන බලපෑම් පිළිබඳව විමසීමක් කරන්න (ලකුණු 6)

08.1.ආකර කර්මාන්තයේ දක්නට ලැබෙන ප්‍රධාන කැණීම් ක්‍රම දෙක නම් කරන්න (ලකුණු 2)

2.ලෝකයේ බහුලව භාවිතාවන බලශක්ති මූලයක් ලෙස පෙට්‍රෝලියම්වල වැදගත්කම කරුණු තුනක් මගින් සාකච්ඡා කරන්න (ලකුණු 6)

3.ආකර කර්මාන්තය තුළ වර්තමානයේ හඳුනාගතහැකි ප්‍රවණතා තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 6)

4.ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි සපයන දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න (ලකුණු 6)

භූගෝලවිද්‍යාව දෙවන ප්‍රශ්න පත්‍රයෙහි I කොටසෙහි 02 ප්‍රශ්නය සඳහා



{සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved}

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Department of Education Southern Province

පළමුවාර පරීක්ෂණය - 2018

භූගෝලවිද්‍යාව	I
Geography	I
புவியியல்	I

22 **S** **I**

සමෝච්ච රේඛා අන්තරය 20m